මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය
ප්‍රාථමික අංශය

අනාවරණ පරීක්ෂණය - 2025 5 ශ්‍රේණිය

01) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ශ්‍රී ලංකාවේ පිහිටි කඳු අතරින් උසින් වැඩිම කන්ද ලෙස සැලකෙන්නේ පිදුරුතලාගල කන්ද යි. එහි උස මුහුදු මට්ටමේ සිට මීටර් 2524 කි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි මෙම කන්දට ගමන් කළ යුත්තේ නුවරඑළිය නගරය හරහා ය. මහවැලි ගඟෙහි අතු ගංගාවක් වන බෙලිහුල් ඔය ආරම්භ වන්නේ ද පිදුරුතලාගල කඳු පන්තිය ආශ්‍රිතවයි. පිදුරුතලාගල කන්ද සමීප වනාන්තරයේ දැකිය හැකි ශාක හා සතුන් අතරින් වැඩි ප්‍රමාණයක් අපේ රටට ආවේණික වෙයි. දියඇලි රැසකින් හැඩ වී ඇති මෙම කන්ද පේදෝ කන්ද යනුවෙන් ද හැඳින් වේ.

1- ශ්‍රී ලංකාවේ පිහිටි උසින් වැඩිම කන්ද නම් කරන්න.

.....

2- මුහුදු මට්ටමේ සිට එහි උස කීය ද?

.....

3- මෙම කන්දට ගමන් කළ යුත්තේ කෙසේ ද?.....

4- මෙම කන්ද හඳුන්වන වෙනත් නමක් ලියන්න.....

5- සෑම අකුරකටම එකම පිල්ලම යෙදී ඇති අකුරු තුනේ වචනයක් සොයා ලියන්න.

.....

02) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

1- විශ්මය/විස්මය 2- ධීවරයා/දීවරයා 3- රූපවාහිනිය/රූපවාහිණිය

03) දී ඇති වචන ගළපා අර්ථවත් වැකි සාදන්න.

1- කියවමි/කතන්දර/මම /පොතක්

.....

2- අපූරු/දියඇල්ලක්/දියකඳ/මවයි.

.....

3- අත්/අපි/සෝදමු/පෙර/කෑමට

.....

04) යුගල පදය සම්පූර්ණ කරන්න.

1- අහල .....

05) විරුද්ධාර්ථ පද ලියන්න.

1- ගැළපෙන - ..... 2-කිකරුයි - .....

06) පහත දැක්වෙන ප්‍රස්තා පිරුළු සම්පූර්ණ කරන්න.

1-.....කැඳ හැලිය වගේ.

2- ඉදිකටුවයි.....

07) සුදුසු ක්‍රියාපද තෝරා හිස්තැනෙහි ලියන්න.

1- කිරිල්ලිය පැටවා සුරතල් .....(කළේ ය./කළා ය.)

2- ක්‍රීඩිකාවෝ තරගයෙන් ජයග්‍රහණය.....(ලැබූ හ./ලැබුවේ ය.)

3- ඔහු මැනවින් අවවාද .....(පිළිගනිති./පිළිගනියි.)

08) අසා ලිවීම

1-..... 2-.....

3-..... 4-.....

5-..... (ලකුණු 1 x 24=24)

09) "පොදු දේපළ සුරකිමු" මාතෘකාව යටතේ වචන හතරකට වැඩි වැකි තුනක් ලියන්න.

.....

.....

.....

.....

.....

(ලකුණු 2 x 3=6)

10) පහත ඉංග්‍රීසි වචනවලට අදාළ රූපය කොටුව තුළ අඳින්න.



Pencil



Dog



Fish

11) ඉංග්‍රීසි බසින් ලියන්න.

1- මුලකුරු සමඟ නම - .....

2- පාසලේ නම - .....

12) පහත වාක්‍ය ගලපා ලියන්න.

is / Father / This / my .....(ලකුණු 1 x 6 = 6)

13) තේරුම සිංහල බසින් ලියන්න.

1- ඌගල් පෙයර් එන්න - .....

2- එනදු වයදු ඔන්බදු - .....

(ලකුණු 1 x 2 = 2)

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.

(01)

1- 6028 යන සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

.....

2- 7900 ට පෙර සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

.....

3- පන්දහස් විස්ස ඉලක්කමෙන් ලියන්න.

.....

4- 8091, 982, 8019, 8190 අවරෝහණ පිළිවෙළට ලියන්න.

.....

5- 7415 මෙම සංඛ්‍යාවේ 7 ඉලක්කමෙන් නිරූපිත අගය ලියන්න.

.....

6- [.....] x 4 = 36 හිස් කොටුවට ගැළපෙන සංඛ්‍යාව ලියන්න.

7- .....VIII.....පෙර හා පසු සංඛ්‍යා රෝම සංඛ්‍යාවලින් ලියන්න.


8- බටහිර දිශාවට විරුද්ධ දිශාව නම් කරන්න.....

9- සති එකයි දින 5 ට දින කීය ද? .....


10- ලීටර 2 ට මිලිලීටර කීය ද?.....

(02)

1) පහත දී ඇති ප්‍රශ්නයේ මුලින් දී ඇති විනිවිද පෙනෙන රූප දෙක එකමත එක තැබූ විට ලැබෙන පිළිතුර තෝරන්න.



(i) (ii) (iii)



2) රටාව හඳුනාගෙන හිස්තැනට ආයුතු සංඛ්‍යාව තෝරන්න.

7 5	9 8	4 8
43	90	
2 4	6 3	9 2

i) 50 ii) 72 iii) 23

(03) පිළිතුරු ලියන්න.

1- වෙරළු ගෙඩි 20 කින් අඩකට වෙරළු ගෙඩි කීය ද? .....

2- පැන්සල් 19 ක් හතර දෙනෙකු අතර සමසේ බෙදූ විට එක් අයෙකුට ලැබෙන පැන්සල් ගණන කීයද? ඉතිරි පැන්සල් ගණන කීයද?

....

(04) විසඳන්න.

1) 2841 +1623 ====

2) 7489 - 4657 ====


3) $2\overline{)904}$

4) $4\overline{)512}$

(05) ගැළපෙන පරිදි යා කරන්න.

i) සමාන මුහුණත් හයක් ඇති ඝනවස්තුවකි.	චතුස්තලය
ii) දාර හයක් සහිත ඝනවස්තුවකි.	ඝනකාභය
iii) මුහුණත් දෙකක් පමණක් ඇති ඝනවස්තුවකි.	ඝනකය
iv) එකිනෙකට අසමාන මුහුණත් ඇති ඝනවස්තුවකි.	සිලින්ඩරය

(06) වේලාව 2.35 ඔරලෝසු මුහුණතේ දක්වන්න.



(07) ගැටලු විසඳන්න.

i) වට්ටක්කා ගෙඩියක බර 3 Kg 750 g කි. ඉන් 1 Kg 150 g ක බර කොටසක් කපා විකුණූ පසු ඉතිරිවන කොටසේ බර කොපමණ ද? .....

ii) අම්මා ඇඳුමක් මැසීමට රෙදි මීටර 5m 20 cm ක ප්‍රමාණයක් ගෙනාවාය. එය සෙන්ටිමීටරවලින් කොපමණ ද? .....

iii) ටැංකියක ජලය 4 l 550 ml තිබුණු අතර එයට තවත් ජලය 3 l 540 ml එක් කළ විට එහි ඇති මුළු ජල ප්‍රමාණය කොපමණ ද? .....

(08) **බිල්පත සම්පූර්ණ කරන්න.**

ද්‍රව්‍ය	ප්‍රමාණය	එකක මිල රු. ස.	වටිනාකම රු. ස.
පැන්සල්	4	40. 00	i) .....
අභ්‍යාස පොත්	i)	120. 00	360. 00
කතුරු	2	iii)	150. 00
එකතුව			iv).....

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) පොදු ස්ථාන පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
   i) රෝහල, පාසල, බැංකුව, ආපණ ශාලාව
   ii) පාසල, සුපිරි වෙළඳසැල, පොළ, දුම්රිය
   iii) පාසල, බැංකුව, රෝහල, පොදු වාහන

2) සූර්ය නමස්කාර ක්‍රියාකාරකමේ තුන්වන අවස්ථාව වන්නේ,



i)



ii)



iii)

3) කාලසටහනකට වැඩ කිරීම නිසා සිදුවන වාසියකි.
   i) කාලය නාස්ති නොවීම ii) වැඩ අතපසු වීම iii) කලට වේලාවට වැඩ කර ගත නොහැකි වීම.

4) නළලට තිලකය තබන්නේ,
   i) සිංහල කාන්තාවන්ය. ii) මුස්ලිම් කාන්තාවන්ය. iii)දෙමළ කාන්තාවන්ය.

5) ජාතික කොඩියේ රතු පාට පසුබිමින් නිරූපණය වන්නේ,
   i) සිංහල ජාතිය. ii) ජාතික අභිමානය. iii) සතර බ්‍රහ්ම විහරණ

6) බීජ ව්‍යාප්ත කරන සතෙකු වේ.
   i) වවුලා
   ii) පිළිහුඩුවා
   iii) කබරගොයා

7) ඇවිදීමේදී පාදය බිම වදින නිවැරදි අනුපිළිවෙළ වන්නේ,
i) පතුල, ඇඟිලි, විළුඹ ii) ඇඟිලි, පතුල, විළුඹ iii) විළුඹ, පතුල, ඇඟිලි

8) පෞද්ගලිකව පරිහරණය කරන උපකරණයකි.
i) පාපිස්ස ii) පනාව iii) රූපවාහිනිය

9) බරක් ඉහළට ඔසවා ගැනීම සඳහා භාවිත කරන වැඩ පහසු කිරීමේ උපකරණයකි.
i) කැස්පර් වීල් ii) ආනත තල iii) කප්පිය

10) පඳුරක් ලෙස නොවැඩෙන ශාකයකි.
i) අන්නාසි ii) පිටවක්කා iii) සැවැන්දරා

11) පත්‍ර බෙදී ඇති ශාකයකි.
i) කොහොඹ ii) බණ්ඩක්කා iii) අඹ

12) අධික සීනි හා පිටි සහිත ආහාර ගැනීම නිසා සෑදෙන රෝගයක් නොවේ.
i) දියවැඩියාව ii) ස්ථූලතාවය iii) මැලේරියාව

13) ඇඹුල් සහිත ආහාරවල බහුලව අඩංගු විටමින් වර්ගය වන්නේ,
i) විටමින් K ii) විටමින් C iii) විටමින් A

14) ටොනික් මූඩිවල දම්පාට කඩදාසි අලවා ඔබ විසින් නිර්මාණය කරනු ලැබුවේ,
i) දෙල් ගෙඩියකි ii) කොස් ගෙඩියකි iii) මිදි පොකුරකි

15) අතීතයේ ශ්‍රී ලංකාවේ ගඟකින් එතෙර වීම සඳහා භාවිත කළ ක්‍රමයකි,
i) නැව්වලින්යාම ii) ඔරුවෙන් යාම iii) පාපැදියෙන් යාම

16) අධිවේගී මාර්ගවල සම්මත ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,
i) E ii) B iii) A

17) නයිට් පදවියෙන් පිදුම් ලැබුවේ,
i) ඇස්. මහින්ද හිමි ii) මාර්ටින් වික්‍රමසිංහ ගුරින්ය. iii) ආතර් සී ක්ලාක් මහතා ය.

18) නිල ඇඳුමක් නොමැති වෘත්තිකයෙකු වන්නේ,
i) හෙදිය ii) ගුරුවරයා iii) පොලිස් නිලධාරියා

19) ජල මූලාශ්‍ර වියළී යාමට බලපාන ප්‍රධාන හේතුව වන්නේ,
i) අධික හිරු එළිය ii) ගස්වැල් කපා දැමීම iii) වැස්ස නොලැබීම


20) වර්තමානයේ ජලය පිරිසිදු කිරීම සඳහා භාවිත වන රසායනික ද්‍රව්‍යයකි,

i) අයඩින් ii) නිල් iii) ක්ලෝරීන්

21) මිනිසුන්ගෙන් සතුන්ට වන හානියකි,

i) ආහාර පාන ලබාදීම ii) පිරිසිදු කිරීම iii) සතුන් සිර කර තැබීම

22) මෙම මැහුම් ක්‍රමය වන්නේ



i) දම්වැල් මැස්ම
ii) කතිර මැස්ම
iii) බ්ලැන්කට් මැස්ම

23) "එක් වෙලා ගියෝ පන් උදුරන්ට ගියෝ" මෙම කවිය,

i) නෙළුම් කවියකි ii) ගොයම් කවියකි iii) පැල් කවියකි

24) රාත්‍රී කාලයේ පිපෙන මල්වල ලක්ෂණයකි.

i) විවිධ පාටින් යුක්ත වීම ii) දුඟඳ හැමීම iii) සුදු පාටින් යුක්ත වීම

25) පාසලේ ඉතිහාසය දැන ගැනීමට උදවු වේ.

i) නාම ලේඛනය ii) වාර්තා පොත iii) ලොග් පොත

26) කලා වැව සෑදූ රජතුමා වන්නේ,

i) මහසෙන් රජතුමාය. ii) පණ්ඩුකාභය රජතුමාය. iii) ධාතුසේන රජතුමාය.

27) සන්නිවේදනයේ අංග තුන පිළිවෙලින්,


i) මාධ්‍යය, ලබන්නා, යවන්නා ii) යවන්නා, මාධ්‍යය, ලබන්නා iii) ලබන්නා, මාධ්‍යය, යවන්නා

- පහත සඳහන් උපකරණ නම් කරන්න.


28)



29)



30)



(ලකුණු 1x 30 = 30)

…….…… …… …….……

පිරිසිදුකමට හා අත්අකුරුවලට ලකුණු 02 ක් ලබා දෙන්න.